# කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය

## උතුරු මැද පළාත

## ව්‍යාපෘති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම

ලෝක බැංකු ණය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය, කුඩා පරිමාණ ගොවීන්ට තරඟකාරී සහ අලෙවි කළ හැකි කෘෂි නිෂ්පාදනයන් වැඩිදියුණු කරගැනීමට සහ වාණිජ ගොවිතැන කරා නැඹුරු කරවීම සඳහා සහයෝගය ලබා දේ. මෙම ව්‍යාපෘතියේ උතුරු මැද පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් විසින් 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව මතු දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අයවළුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මූල්‍ය කළමනාකරණ විශේෂඥ (PS3) - තනතුරු 01 යි.

**අවශ්‍ය සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූල්‍ය කළමනාකරණය හෝ ගණකාධිකරණය ප්‍රධාන විෂයක් සහිතව ප්‍රථම උපාධියක්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය/ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකමක්

**සමඟ**

අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 10 ක පළපුරුද්ද.

**හෝ**

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූල්‍ය කළමනාකරණය හෝ ගණකාධිකරණය ප්‍රධාන විෂයක් සහිතව ප්‍රථම උපාධියක්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය/ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකමක්

**සහ**

මූල්‍ය කළමනාකරණ හෝ ගණකාධිකරණ පශ්චාත් උපාධියක් හෝ ආයතනික / වරලත් සාමාජිකත්වයක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

**සමඟ**

අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 8 ක පළපුරුද.

**හෝ**

03. අදාළ ක්ෂේත්‍රයේ දීප ව්‍යාප්ත සේවයක I පන්තියේ නිලධාරියෙකු වීම

**සමඟ**

අවම වශයෙන් පළමු පන්තියේ තනතුරක වසර 3 ක පළපුරුද්ද.

**විශේෂ සුදුසුකම:**

රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහ මනා දැනුමක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**

සුදුසුකම් සහ පළපුරුද්ද මත පාදකව,කෙටි ලැයිස්තු ගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

**වැටුප:**

2013.03.15 දිනැතිව නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/ 2019 මත පදනම් වනු ඇත.

**පොදු කොන්දේසි:**

අ) වයස් සීමාව – අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 64 නොඉක්මවා තිබීම.

ආ) සේවා කොන්දේසි – රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් ද්විතීය පදනම මත බඳවාගනු ලබන අතර, රජයේ සේවයෙන් බැහැර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සියලුම පත්වීම් සහ සේවා කාලය දීර්ඝ කිරීම් 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පාදක කර සිදු කරනු ලැබේ.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් විසින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය, පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය, ජයන්ති මාවත, අනුරාධපුර ලිපිනයට 2021 අගෝස්තු මස 20 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ස්වකීය අයදුම්පත් ජීව දත්ත තොරතුරු ප්‍රකාශ සමඟින්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනය ද සහිතව හා අදාළ සියලුම සහතිකවල ඡායා පිටපත්ද ඇතුළුව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු /අංශ ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මූල්‍ය කළමනාකරණ විශේෂඥ, උතුරු මැද පළාත - තනතුර සඳහා අයදුම් කිරීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

මේ පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම්, 025-2227890 දුරකථන අංකයෙන් හෝ jcstat11@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයෙන් පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, (උතුරු මැද), අනුරාධපුරය වෙතින් ලබාගත හැක.

**එල්.ජේ.එම්.පී. චන්ද්‍රසිරි බණ්ඩාර,**
**ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත් සභාව.**
**2021.08.06**